# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2018

## විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

(2018.12.28 දිනැති අංක 2103/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් අමාත්‍යාංශයේ නාමය විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ලෙස සංශෝධනය කර ඇත)

## දැක්ම

" ජාතියේ බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම"

## මෙහෙවර

"ජාතික ආර්ථික සෞභාග්‍ය උදෙසා අවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසාර හා මිල දැරිය හැකි බලශක්ති සැපයුමක් සහතික කිරීම"

## පටුන

**පිටු අංකය**


| | | |
|---|---|---|
| 1. | අමාත්‍යාංශය පිළිබඳ හැඳින්වීම | 04 |
| 2. | විදුලිබල හා බලශක්ති අංශය | 09 |
| 3. | සැලසුම් අංශය | 13 |
| 4. | සංවර්ධන අංශය | 16 |
| 5. | තාක්ෂණ අංශය | 21 |
| 6. | ටෙන්ඩර් අංශය | 24 |
| 7. | පාලන අංශය | 29 |
| 8. | ගිණුම් අංශය | 39 |
| 9. | අභ්‍යන්තර විගණන අංශය | 42 |

වගු

2.1 ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා ඉඩම් අත්කර ගැනීම
2.2 2018 වසරේ කරන ලද බදු නිදහස් කිරීම්
4.1 2018 වර්ෂය තුළ පද්ධතියට සම්බන්ධ කරන ලද සූර්ය පියසි ජනන ධාරිතාවය
4.2 'රිවි අරුණ' වැඩසටහන
4.3 රාජ්‍ය අංශයේ ගොඩනැගිලි හරිත බලශක්තියට පරිවර්තනය කිරීම
4.4 ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය බලකාය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති
6.1 කාර්යසාධනයේ සාරාංශය - ටෙන්ඩර් අංශය
6.2 2018 වර්ෂයේ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ
7.1 කාර්ය මණ්ඩල තොරතුරු
7.2 රාජ්‍ය ලේකම් කාර්යාලය සඳහා අනුමත කාර්යය මණ්ඩලය
7.3 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.4 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.5 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.6 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.7 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.8 විදේශීය පුහුණු
7.9 දේශීය පුහුණු
8.1 කාර්යසාධනයේ සාරාංශය - ගිණුම් අංශය
8.2 කාර්යසාධනයේ සාරාංශය - ගිණුම් අංශය
8.3 කාර්යසාධනයේ සාරාංශය - ගිණුම් අංශය
9.1 කාර්යසාධනයේ සාරාංශය - අභ්‍යන්තර විගණන අංශය

ඇමුණුම්

| | |
|---|---|
| වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA – 2(i)) | ඇමුණුම 1 |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය (ACA – 2) | ඇමුණුම 2 |

# 01. අමාත්‍යාංශය පිළිබඳ හැඳින්වීම

2015.09.21 දිනැති අංක 1933/13 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, පහත දැක්වෙන කාර්යයන් සහ කර්තව්‍යයන් මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

## කාර්යයන් සහ කර්තව්‍යයන්

1. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම.
2. විදුලිබල සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත විදුලිබල ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
3. ජලය, තාපය, ගල් අඟුරු සහ සුළං යන මූලාශ්‍රයන් මඟින් විදුලි බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය.
4. ග්‍රාමීය විද්‍යුතනය.
5. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම.
6. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය.
7. අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්ට පැව   ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
8. අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන් අධීක්ෂණය කිරීම.

තව ද එම ගැසට් නිවේදනය ප්‍රකාරව පහත දැක්වෙන ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතනද මෙම අමාත්‍යාංශය යටතට පැවරී ඇත.

## ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන

1. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පාලිත සමාගම්
2. ලංකා විදුලිබල පුද්ගලික සමාගම
3. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම
4. සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
5. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
6. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
7. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

එමෙන්ම අමාත්‍යාංශයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් නෛතික විධිවිධාන අනුගමනය කල යුතුය.

## ක්‍රියාත්මක කළ යුතු නීති

1. ශ්‍රී ලංකා විදුලිබල පනත, 2009 අංක 20
2. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත, 2007 අංක 35
3. බලශක්ති සංරක්ෂණ අරමුදල පනත, 1985 අංක 2
4. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත, 2014 අංක 40
5. වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, අමාත්‍යාංශයේ විෂය පථයට අදාල අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

2018.12.28 දිනැති අංක 2103/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් අමාත්‍යාංශයේ නාමය විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ලෙස සංශෝධනය කර ඇති අතර අමාත්‍යාංශය වෙත පැවරී තිබූ කාර්යයන් හා කර්තව්‍යයන් එකී ගැසට් නිවේදනය මඟින් පහත පරිදි සංශෝධනය කර ඇත.

1. විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන විෂයයට සහ අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම.

2. බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.

3. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනාදී මූලාශ්‍රයන් මගින් විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය

4. හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම

5. ග්‍රාමීය විද්‍යුතනය

6. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම

7. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

8. ආර්ථික සංවර්ධනය උදෙසා ව්‍යාපාර ක්ෂේත්‍රයේ දායකත්වය ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සැලසීම හා සානුබලයන් සැපයීම

9. ශ්‍රී ලංකාව තුල ව්‍යාපාර ඇරඹීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමේ දර්ශකය ඉහල නැංවීමට අවශ්‍ය පියවර ගැනීම

10. පෞද්ගලික ව්‍යාපාර ක්ෂේත්‍රය මුහුණ දෙන ව්‍යාපාර ගැටළු සඳහා අවශ්‍ය ආයතනික සම්බන්ධීකරණය සිදු කිරීම

11. රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර හවුල් ව්‍යාපාර (PPP) ආරම්භ කිරීම සඳහා පහසු හා කාර්යක්ෂම ක්‍රමවේද හඳුන්වාදීම

12. අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු.

13. අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන් අධීක්ෂණය කිරීම.

අමාත්‍යාංශයේ ඉටු කරනු ලබන කාර්යයන් අනුව පහත සඳහන් පරිදි මෙම අමාත්‍යාංශයේ අංශ වෙන්කර ඇත.



# සංවිධාන ව්‍යුහය


ලේකම්
අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන)
අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්)
අතිරේක ලේකම් (විදුලිබල හා බලශක්ති)
අතිරේක ලේකම් (තාක්ෂණ)
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ජ්‍යෙ.ස.ලේ. (පාලන)
ජ්‍යෙ.ස.ලේ. (ප්‍රසම්පාදන)
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍යක්ෂ (විදුලිබල හා බලශක්ති)
අධ්‍යක්ෂ (තාක්ෂණ)
සහකාර ලේකම් (පාලන)
නීති නිලධාරි
සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
ගණකාධිකාරි
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්ථක
තොරතුරු තාක්ෂණ නිලධාරි
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
තොරතුරු තාක්ෂණ සහකාර
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය

# 02. විදුලිබල හා බලශක්ති අංශය

## ප්‍රධාන කාර්යයන්

1. තාප හා ජල විදුලි උත්පාදනය සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කරුණු සහ විශාල හා මධ්‍ය පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
2. ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය සඳහා පරිසර හිතකාමී ඉන්ධනයක් ලෙස ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වාදීමේ කටයුතු
3. විශාල සහ මධ්‍යම පරිමාණයේ ජල විදුලි බලාගාර ව්‍යාපෘති, තාප විදුලි බලාගාර ව්‍යාපෘති, ගල් අඟුරු බලාගාර ව්‍යාපෘති අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු
4. ඉහත සඳහන් ව්‍යාපෘති වලට අදාලව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
5. විදුලිබල හා බලශක්ති අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර පරිපාලනයද ඇතුලත්ව අංශයේ සමස්ථ පරිපාලනය
6. විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයට අදාලව ගරු විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා, ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා සහ ලේකම් විසින් වරින්වර පවරනු ලබන සියළුම රාජකාරි කටයුතු

## කාර්ය සාධනය

1. මෙගාවොට් 900 ක ලක්විජය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය, බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය, ජපාන ජාත්‍යයන්තර සහයෝගීතා ආයතනය (JICA) අරමුදල් සපයන ව්‍යාපෘති ඇතුළුව මහ කොළඹ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පාඩු අවම කිරීමේ ව්‍යාපෘතිය සහ ජාතික සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යන ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් අධීක්ෂණය හා එම ව්‍යාපෘතීන් සඳහා පහසුකම් සැපයීම.
2. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ දැවි අළු අතුරු නිෂ්පාදනයක් ලෙස භාවිත කිරීම සඳහා ව්‍යාපෘති දෙකක් සාර්ථක ලෙස ආරම්භ කර ඇත. ඒ අනුව ගඩොල් කර්මාන්ත ශාලා දෙකක් ස්ථාපනය කර ඇති අතර එක් කර්මාන්තශාලාවක් නොරොච්චෝලේ සහ අනෙක් කර්මාන්තශාලාව පුත්තලම කර්මාන්ත ප්‍රදේශයේ ස්ථාපනය කර ඇත. මෙය බලාගාරයේ පාවෙන අළු සහ පහළ අළු කළමණාකරණය සම්බන්ධ ගැටළුව විසඳනු ඇත.
3. ලංකා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා ඉඩම් අත්කර ගැනීම.

| ව්‍යාපෘතිය | තොරතුරු සහ අරමුණ | ප්‍රමාණය |
|---|---|---|
| කෙරවලපිටිය LNG විදුලි බලාගාර ව්‍යාපෘතිය. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් අනාගතයේ ඉදිකිරීමට යෝජිත විදුලි බලාගාර සඳහා අක්කර 110 පමණ ඉඩම් ප්‍රමාණයක් අත්කරගෙන ඇත.<br>ලංකා විදුලිබල මණ්ඩලයේ දීර්ඝ කාලීන ජනන සැළැස්මට අනුව අක්කර 110ක ඉඩමෙන් අක්කර 42ක් රජයට අයත් වන අතර අනෙක් අක්කර 68ක ඉඩම් ප්‍රමාණය ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරිමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් වේ. | අක්කර 110 |
| පිවිතුරු බලශක්ති සහ ජාලගත කාර්යක්ෂමතා | කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම පිහිටා ඇත. | පර්චස් 20.75 |

| | | |
|---|---|---|
| වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය. (ව්‍යාපෘති පැකේජ 02) | අතුරුගිරිය පාදුක්ක 132 කිලෝ වෝල්ට් සම්ප්‍රේෂණ මාර්ගයේ විදුලි කුළුණු හා විදුලි රැහැන් ඉදිකිරීම. | |
| පිවිතුරු බලශක්ති සහ ජාලගත කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය. (ව්‍යාපෘති පැකේජ 03) | කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම පිහිටා ඇත.<br>පන්නිපිටිය උප පොළ අසල පර්යන්ත කුළුණ ඉදිකිරීම. | හෙක්ටයාර 0.1939 |
| බුලත්සිංහල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම | කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම පිහිටා ඇත.<br>බුලත්සිංහල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම. | හෙක්ටයාර 0.4047 |
| දෙකටන පවත්නා ගැන්ට්‍රි සඳහා ඉඩම් අවශ්‍යතා | ගම්පහ දිස්ත්‍රික්කයේ නාමළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම පිහිටා ඇත.<br>ප්‍රවේශ මාර්ග සඳහා ඉදි කිරීම. | පර්චස් 05.00 |
| මිල්ලනිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම. | කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම පිහිටා ඇත.<br>බණ්ඩාරගම ප්‍රදේශයේ මිල්ලනිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම. | රූඩ 03<br>පර්චස් 28.5 |
| කිරිදිවෙළ ග්‍රිඩ් උපපොළ සහ බත්තරමුල්ල ග්‍රිඩ් උපපොළ ඉදි කිරීම හා වේයන්ගොඩ ග්‍රිඩ් උපපොළ ව්‍යාප්ත කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම. | ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම පිහිටා ඇත.<br>කිරිදිවෙළ ග්‍රිඩ් උපපොළ සහ බත්තරමුල්ල ග්‍රිඩ් උපපොළ ඉදි කිරීම හා වේයන්ගොඩ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීමේ කටයුතු දීර්ඝ කිරීම. | හෙක්ටයාර 8.0872 |

*වගු අංක 2.1*

4. ශ්‍රී ලංකාවේ බලශක්ති ජනනය සඳහා පරිසර හිතකාමී ඉන්ධන ලෙස හඳුන්වන ස්වභාවික ද්‍රවීකෘත වායු (LNG) හඳුන්වාදීම. මෙය ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ.

4.1 <u>ඉන්දියානු රජය සමඟ රජයෙන් රජයට පදනම මත ඉදිකරනු ලබන මෙගාවොට් 500 ක ධාරිතාවයෙන් යුත් ස්වභාවික ද්‍රවීකෘත වායු විදුලි බලාගාරය.</u>

- අනාගතයේදී LNG විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන ඉඩම් කෙරවලපිටිය ප්‍රදේශයෙන් හඳුනා ගෙන ඇති අතර, ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, ඉඩම් කොමසාරිස් ජනරාල් සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ ඉදිකිරීම් කටයුතුවලට අදාළ කටයුතු සිදුකරමින් පවතී.

4.2 <u>ජපාන රජය සමඟ රජයෙන් රජයට පදනම මත කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිකරනු ලබන මෙගාවොට් 500 ක ධාරිතාවයෙන් යුත් ස්වභාවික ද්‍රවීකෘත වායු විදුලි බලාගාරය</u>

- ජපන් රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය අතර අවබෝධතා ගිවිසුමක් සහ සහයෝගීතා ගිවිසුමක් 2018.08.18 වන දින අත්සන් කර ඇත.

- ජපන් රජය සහ ශ්‍රී ලංකා රජය අතර හතරවෙනි ඒකාබද්ධ කමිටුව 2018.08.18 වන දින කොළඹදී පවත්වන ලදි.

4.3 <u>චීන රජය සමඟ රජයෙන් රජයට පදනම මත ඉදිකරනු ලබන මෙගාවොට් 400 ක ධාරිතාවයෙන් යුත් ස්වභාවික ද්‍රවීකෘත වායු විදුලි බලාගාරය</u>

- චින රජය සමඟ ඉදිකිරීමට යෝජිත බලාගාරය ක්‍රියාත්මක කිරීම සඳහා අත්සන් කිරීමට යෝජිත අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා ලං.වි.ම වෙත යොමු කර ඇත.

- චින රජය සහ ශ්‍රී ලංකා රජය අතර පළමු ඒකාබද්ධ කමිටුව 2018.01.10 වන දින පවත්වන ලදි.

4.4. <u>දකුණු කොරියානු M/s SK E & S Company විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පදනම් කරගෙන ස්විස් චැලේන්ජ් (Swiss Challenge) ප්‍රසම්පාදන ක්‍රමවේදය භාවිතා කර ඉදිකිරීමට යෝජිත ද්‍රවීකෘත ස්වභාවික වායු ගොඩබෑම සහ නැවත ගෑස් බවට පත් කිරීම සඳහා පාවෙන ස්වභාවික වායු පර්යන්තය</u>

- ස්විස් චැලේන්ජ් ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා පත්කරන ලද විශේෂ කමිටුව වෙනුවෙන් මෙම අමාත්‍යාංශය විසින් ඉදිකිරීමට යෝජිත ද්‍රවීකෘත ස්වභාවික වායු ගොඩබෑම සහ නැවත ගෑස් බවට පත් කිරීම සඳහා පාවෙන ස්වභාවික වායු පර්යන්තය සඳහා මේවන විට ආයෝජකයින් ලංසු යෝජනා කැඳවා ඇත. (*Supplement 30 to the Government Tender Procedure – Part II Private Sector Infrastructure project, Reference 237- Dealing with Unsoiled project proposals instructions of "Swiss Challenge procedure" dated 26.12.2016*)

5. ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත වෙස්ට් කෝස්ට් පුද්ගලික සමාගම, ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම සහ ලක්දනව් සමාගම විසින් තම ව්‍යාපෘති (ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම සහ පුනර්ජනනීය විදුලි යෝජනා ක්‍රම හැර) සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍රෝපකරණ වෙනුවෙන් එකතු කල අගය මත බදු, තීරු බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා වරාය ගුවන් තොටුපල බදු නිදහස් කිරීම සඳහා නිර්දේශ මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

| ආදායම් සංරක්ෂණ ආඥා පනත අනුව තීරු බදු නිදහස් කිරීම. | 2008 අංක 15 දරණ (සංශෝධිත) වැට් බදු පනත අනුව වැට් බදු වලින් නිදහස් කිරීම<br>2009 අංක 32 දරණ (සංශෝධිත) ජාතිය ගොඩනැගිමේ බදු වලින් නිදහස් කිරීම | "NFE" පදනම මත භාණ්ඩ ආනයනය කිරීම සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම |
|---|---|---|
| 1560 | 469 | 102 |

*වගු අංක 2.2*

6. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලට අදාල කටයුතු සඳහා පැමිණෙන විදේශ කාර්ය මණ්ඩල වලට වීසා ලබා ගැනීම සඳහා ආගමන හා විගමන සේවා දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

7. මහජනතාවගෙන් ලැබුණු පැමිණිලි විසඳීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය, මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණය කිරීම.

8. දිවයිනේ විවිධ පළාත්වල ආගමික ආයතන විසින් සිදු කරනු ලබන ආගමික කටයුතු සඳහා විදුලිය සැපයීම සහ මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ඉල්ලීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම

# 03.සැලසුම් අංශය

## ප්‍රධාන කාර්යයන්

1. විදුලිබල ක්ෂේත්‍රයේ සැලසුම් සකස් කිරීම
2. ව්‍යාපෘති වැඩසටහන් සංවර්ධනය හා ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීම
3. ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා සමාලෝචනය
4. පර්යේෂණ හා සංවර්ධන කටයුතු
5. ආපදා කළමනාකරණ වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
6. සංවර්ධන ව්‍යාපෘති සඳහා වන වාර්ෂික අයවැය සකස් කිරීම
7. විදුලිබල ක්ෂේත්‍රයට අදාළ දේශගුණික විපර්යාස පිළිබඳ කටයුතු හා පාරිසරික කටයුතු
8. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්යයන්
9. ස්ත්‍රී පුරුෂභාවය පදනම් කර ගත් අයවැය වැඩසටහන්වලට අදාළ කාර්යයන්

## කාර්ය සාධනය

### 1. විදුලිබල ක්ෂේත්‍රයේ සැලසුම් සකස් කිරීම

- විදුලිබල ක්ෂේත්‍රයේ අදාළ පාර්ශ්වකරුවන් සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ (PUCSL) අදහස් සහිතව, ලංවිම 2018 - 2037 දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) සකස් කිරිම සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.
- අමාත්‍යාංශයේ එක් එක් අංශයන් සඳහා සහ අමාත්‍යාංශ අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන සියලු සංවර්ධන ව්‍යාපෘති සඳහා 2018 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන ලදී.

### 2. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායයන්

වසර 2050 වන විට පූර්ණ කාබන්හරණ තත්ත්වය සාක්ෂාත් කර ගැනීමේ අරමුණ කරා එළඹීම සඳහා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායයන් සමාලෝචනය කරනු ලබයි. ගරු විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා විසින් බලශක්ති ප්‍රතිපත්තිය සමාලෝචනය කිරිමේ කමිටුවක් පත් කරන ලද අතර, එම විශේෂඥ කමිටුව විසින් බලශක්ති ප්‍රතිපත්තිය සමාලෝචනය කරමින් පවතී.

### 3. 2019 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ ප්‍රාග්ධන අයවැය සකස් කිරීම.

අමාත්‍යාංශයේ විෂයය පථය යටතේ වන ආයතනවලින් ඉදිරිපත් වූ සියලු යෝජනා සමාලෝචනය කිරිමෙන් පසු, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන අයවැය කෙටුම්පත සකස් කරන ලදී. 2019 ප්‍රාග්ධන අයවැය සකස් කර අවසන් කිරිම සඳහා අයවැය සමාලෝචන රැස්වීම පවත්වන ලදී.

### 4. "2018 කාර්ය සාධනය සහ 2019 වර්ෂය සඳහා වැඩසටහන්" වාර්තාව සකස් කිරීම.

"2018 කාර්ය සාධනය සහ 2019 වර්ෂය සඳහා වැඩසටහන්" වාර්තාව සකස් කිරීම, 2019 වාර්ෂික අයවැය සඳහා වන පූර්ව අවශ්‍යතාවකි. විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශයේ විෂයය පථය යටතේ වන ආයතනවල 2018 වර්ෂයේ ප්‍රාග්ධන අයවැයට අදාළ කාර්ය සාධනය සහ 2019 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් අන්තර්ගත කර මෙම වාර්තාව සකස් කරන ලදී.

### 5. සංවර්ධන ව්‍යාපෘතිවල කාර්ය සාධනය අධීක්ෂණය

ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන (ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්) විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති අමාත්‍යාංශය මගින් ආරම්භ කර ඇත. විදුලි සැපයුමේ විශ්වසනීයත්වය සහ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ නව ජනන පහසුකම් වෙතින් විදුලිය එක් කර ගැනීමේ හැකියාව ඇති කිරීම සඳහා සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීමෙන්, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් ජාලය සංවර්ධනය කර ඇත. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ජාලයට සංකලනය කිරිම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. සැලසුම් කරන ලද පරිදි ව්‍යාපෘති අවසන් කිරිම තහවුරු කිරිම සඳහා අමාත්‍යාංශය මගින් මෙම සියලු ව්‍යාපෘතීන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කරනු ලබයි.

I. විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය කාර්තු වශයෙන් අධීක්ෂණය කරන ලද අතර, අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සහ අමාත්‍යාංශය යටතේ වන ආයතනවල ප්‍රධානීන්ගේ හා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් හතරක් පවත්වන ලදී.

II. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් සහ උපදෙස්, මෙම රැස්වීම්වලදී ලබා දෙන ලදී.

III. ප්‍රගති වාර්තා සකස් කර, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ස අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.

IV. ජාතික ප්‍රතිපත්ති රාමුවට අදාළ ප්‍රගති වාර්තා, කාර්තුමය ප්‍රගති වාර්තා, මධ්‍ය වාර්ෂික ප්‍රගති වාර්තා සහ 2018 වර්ෂයේ ප්‍රගති වාර්තා සකස් කර, ජනාධිපති කාර්යාලය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, ආසියානු සංවර්ධන බැංකුව (ADB), ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA), ශ්‍රී ලංකා මහ බැංකුව ආදී අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.

V. "සූර්ය බල සංග්‍රාමය" වැඩසටහනේ මාසික ප්‍රගතිය අධීක්ෂණය සිදු කරන ලදී.

VI. උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර, අවශ්‍ය ප්‍රගති වාර්තා සපයන ලදී.

**6.** විදුලිබල ක්ෂේත්‍රයේ කාබන් විමෝචනය අඩු කිරීම සඳහා ජාතික මට්ටමෙන් පිළිගත් දායකත්වය (NDCs) පිළිබඳ පූර්ව සූදානම ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර, එම වැඩසටහන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ මැදිහත්කරු ලෙස ක්‍රියා කරන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

**7.** ලෝක බලශක්ති සභාව සමඟ එකඟ වී ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලෝක බලශක්ති සභාව, ශ්‍රී ලංකාවේ සාමාජික කමිටුව හා අදාළ අනෙකුත් ආයතන සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

**8.** පුනර්ජනනීය බලශක්ති ජනන ව්‍යාපෘති සඳහා කාබන් හවුල්කාරිත්ව පහසුකම වැඩසටහන ලෝක බැංකුවේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසා ඇත. ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සමඟ, පරිසර සමාජීය කළමනාකරණ රාමුව සකස් කර නිම කිරීමට පහසුකම් සලසා ඇත.

**9.** **සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර නිෂ්කාශණය.**

හබරණ - වේයන්ගොඩ කිලෝ වෝල්ට් 220 හා හබරණ - සාම්පූර් කිලෝ වෝල්ට් 400 සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ව්‍යාපෘති සඳහා පාරිසරික නිෂ්කාශන නිකුත් කිරීමේ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය මෙම අමාත්‍යාංශයයි. මෙම ව්‍යාපෘති දෙකෙහි පරිසර නිෂ්කාශනවල වලංගු කාලය අවසන් වූ අතර, තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් පැවැත්වීමෙන් හා අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් පසුව 2018 වර්ෂයේදී පරිසර නිෂ්කාශනයන්හි වලංගු කාලය දීර්ඝ කරන ලදී.

**10.** තිරසර සංවර්ධන ඉලක්කයන්හි 7 වන ඉලක්කය හා සම්බන්ධිත ගෝලීය පාර්ශවකරුවන් හා තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත අදාළ දත්ත, තොරතුරු හා යෙදවුම් සපයා ඇත.

**11.** මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන ජාතික භෞතික සැලැස්ම සඳහා දායක විය.

**12.** ස්ත්‍රී මූලික ගෘහ ඒකක පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම අවසන් කිරීම සඳහා දායකත්වය දක්වන ලද අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.

**13.** **සැලසුම් අංශය මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ**

- ශ්‍රී ලංකාවේ විදුලිබල ජනන සංයුතිය තීරණය කිරීම - ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව

# 04. සංවර්ධන අංශය

## ප්‍රධාන කාර්යයන්

1. විදුලිබල ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම
2. රට තුළ ග්‍රාමීය විදුලියන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
3. ව්‍යාපෘති මූල්‍යයනය සහ දායකත්ව සම්බන්ධීකරණය - බහුපාර්ශවීය සම්බන්ධීකරණය
4. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම
5. තොරතුරු තාක්ෂණ කාර්යයන් සංවර්ධනය
6. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ වන කාර්යයන්

## කාර්ය සාධනය

### 1. විදුලි සැපයීම

විදුලි සේවා සම්බන්ධතා ලබා ගැනීම හා විදුලි බලය සම්බන්ධයෙන් වන විවිධ ගැටළු සඳහා විවිධ පුද්ගලයින්, රාජ්‍ය හා පුද්ගලික ආයතන මගින් සිදු කරන ඉල්ලීම් සඳහා පහසුකම් සැපයීම සහ ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පුද්. සමාගම සමඟ සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී.

### 2. සූර්ය බල සංග්‍රාමය වැඩසටහන

“සූර්ය බල සංග්‍රාමය” යනු විදුලි පාරිභෝගිකයන්ගේ නිවාසවල / පරිශ්‍රවල පියසි මත සවි කළ සූර්ය පැනල මගින් නිපදවෙන විදුලිය ජාතික ජාලයට සම්බන්ධ කිරීම සඳහා හඳුන්වා දුන් ප්‍රජා පාදක විදුලි ජනන වැඩසටහනකි. අමාත්‍යාංශය, මෙම ව්‍යාපෘතිය 2016 සැප්තැම්බර් මස 06 දින ආරම්භ කරන ලද අතර 2018 වර්ෂය පුරා පවත්වා ගෙන යන ලදී. ශුද්ධ මනුකරණය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) හා නෙට් ප්ලස් (Net Plus) යන ක්‍රමවේද තුන අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. අමාත්‍යාංශය, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට, ලංකා විදුලිබල මණ්ඩලයට සහ ලංකා විදුලි පුද්. සමාගමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

- **සූර්ය බල සංග්‍රාමය I**

I. <u>සූර්ය පියසි වැඩසටහන</u>

මෙම වැඩසටහනේ ඉලක්කය වනුයේ 2025 වර්ෂය වන විට සූර්ය පියසි 1,000,000 ක් මඟින් මෙගා වොට් 1,000 ක විදුලි ධාරිතාවක් ජනනය කිරීමයි.

මේ වන විට පාරිභෝගිකයින් 19,166 ක් විසින් ජාතික ජාලයට මෙගා වොට් 177 ක ධාරිතාවක් සම්බන්ධ කර ඇත. (සූර්ය බල සංග්‍රාමය යටතේ ස්ථාපනය කරන ලද සූර්ය ජනන කට්ටල මගින් මෙගා වොට් 145 ක් හා සූර්ය බල සංග්‍රාමයට පෙර ස්ථාපනය කරන ලද සූර්ය ජනන කට්ටල මඟින් මෙගා වොට් 31.825 ක්)

| මාසය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධාරිතාව (මෙගා වොට්) | 5.51 | 5.82 | 3.15 | 2.60 | 11.37 | 3.76 | 7.85 | 5.61 | 6.31 | 8.73 | 6.58 | 10.36 | **77.64** |
| පද්ධති සංඛ්‍යාව | 581 | 472 | 410 | 254 | 376 | 374 | 499 | 463 | 454 | 472 | 498 | 614 | **5,467** |

*වගු අංක 4.1*

II. “රිවි අරුණ” වැඩසටහන

ආගමික ස්ථානවල සූර්ය පියසි ස්ථාපනය කිරීම සඳහා ඉහත වැඩසටහන මෙම අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්. සමාගම හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් දියත් කරන ලදී. මේ සඳහා වැය වූ මුළු පිරිවැය රුපියල් මිලියන 58 කි.

| ආගමික ස්ථානය | සංඛ්‍යාව | ධාරිතාව (කිලෝ වොට්) |
|---|---|---|
| පන්සල් | 126 | 252 |
| ඉස්ලාම් දේවස්ථාන | 4 | 8 |
| කෝවිල් | 3 | 6 |
| ක්‍රිස්තියානි දේවස්ථාන | 2 | 4 |
| **එකතුව** | **135** | **270** |

*වගු අංක 4.2*

III. රාජ්‍ය අංශයේ ගොඩනැගිලි හරිත බලශක්තියට පරිවර්තනය කිරීම

2017 අයවැය යෝජනාවක් අනුව මෙම වැඩසටහන දියත් කරන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේ අයවැය මඟින් රුපියල් මිලියන 245 ක් ලබා දෙන ලදී. මේ යටතේ රාජ්‍ය ආයතන 77 ක සූර්ය පැනල ස්ථාපනය කිරීම මඟින් හරිත බලශක්තිය ජනනය කර ඇත.

| රාජ්‍ය ආයතනය | සංඛ්‍යාව | ධාරිතාව (කිලෝ වොට්) |
|---|---|---|
| රෝහල් | 63 | 1,260 |
| පාසැල් | 13 | 130 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 1 | 10 |
| **එකතුව** | **77** | **1,400** |

*වගු අංක 4.3*

- **සූර්ය බල සංග්‍රාමය II**

  මෙගා වොට් 01 බැගින් 37 ක් සහ මෙගා වොට් 01 බැගින් 90 ක් ලෙස වන සූර්ය බල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය පහසුකම් සලසා ඇත. 2018 වර්ෂයේ දී තරඟකාරී ලංසු ක්‍රමවේදය මඟින් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගන්නා ලදී.

- **සූර්ය බල සංග්‍රාමය III**

  මෙගා වොට් 10 බැගින් වන සූර්ය බල ව්‍යාපෘති 05 ක් ලෙස මෙගා වොට් 50 ක සූර්ය බල ධාරිතාවක් ජනනය කිරීමට සැලසුම් කර ඇත. වාලච්චේන මෙගා වොට් 10 සහ වවුනතිවු මෙගා වොට් 10 සූර්ය බල ව්‍යාපෘති නිම කිරීමට නියමිතය.

**3. සූර්ය බල උද්‍යාන සහ සුළං බල උද්‍යාන ක්‍රියාත්මක කිරීම**

- පූනරීන් සහ මොණරාගල සූර්ය බල උද්‍යාන ඉදි කිරීම ආරම්භ කිරීම සහ චුන්නාකම් ප්‍රදේශයේ පිහිටි සුළං බල උද්‍යානය ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට සහ පුද්ගලික අංශයට පහසුකම් සලසා ඇත.
- පූනරීන් ප්‍රදේශයේ සූර්ය / සුළං දෙමුහුම් බලශක්ති උද්‍යානය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට පහසුකම් සලසා ඇත.

**4. ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමනාකරණය පිළිබඳව වන ජනාධිපති කාර්ය සාධන බලකාය**

ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමනාකරණ වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය සිදු කර ඇත. ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් ව්‍යාපෘති මඟින් මීළඟ වසර 05 ක කාලය තුළ ගිගා වොට් පැය 1,000 ක සාමාන්‍ය බලශක්ති ධාරිතාවක් ඉතිරි කර ගත හැකි වනු ඇතැයි බලාපොරොත්තු වෙයි.

| අ.අ. | ව්‍යාපෘතිය | වසර 2022 වන විට වාර්ෂික බලශක්ති ඉතිරිය (ගිගා වොට් පැය) |
|---|---|---|
| **1** | **කාර්යක්ෂම වායු සමීකරණය.**<br>දැනට පවත්නා අකාර්යක්ෂම ඒකීය වායු සමීකරණ යන්ත්‍ර වෙනුවට කාර්යක්ෂම වායු සමීකරණ යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. වායු සමීකරණ යන්ත්‍රවල කාර්යක්ෂමතාව මිණුම් කිරීම සඳහා විද්‍යාගාරයක් මිල දී ගැනීමට හා ඒ හා සම්බන්ධ වන පිරිවිතර සම්බන්ධයෙන් වන ව්‍යාපෘති යෝජනාවක් සූදානම් කර ඇත. | 84 |
| **2** | **කාර්යක්ෂම ආලෝකකරණය.**<br>අකාර්යක්ෂම නිමැවුම් හා අකාර්යක්ෂම ආලෝකකරණය හේතුවෙන් කාර්මික හා වාණිජ අංශයන්හි සිදු වන බලශක්ති හානි වීම අවම කර ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ක්ෂේත්‍රයන්හි කාර්යක්ෂම ආලෝකකරණ භාවිතය හේතුවෙන් සිදු වන බලශක්ති ඉතිරිය සම්බන්ධයෙන් වන තොරතුරු එක් රැස් කිරීම සඳහා උචිත අධ්‍යයනයක් ආරම්භ කර ඇත. | 250 |
| **3** | **කාර්යක්ෂම ශීතකරණ.**<br>ගෘහස්ත අංශයේ භාවිතා වන යල් පැන ගිය ඉවත් කිරීමට සුදුසු ශීතකරණ වෙනුවට අධි කාර්යක්ෂම ශීතකරණ ප්‍රතිස්ථාපනය කෙරෙමින් පවතී. මේ සඳහා වන මෙහෙයුම් මාර්ගෝපදේශ සකස් කර ඇති අතර, 2019 වර්ෂයේ දී ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වේ. මීට අමතරව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පරිසර හිතකාමී (e-friend) ණය යෝජනා ක්‍රමයක සහයෝගය සහිතව නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ඇත. | 161 |
| **4** | **කාර්යක්ෂම ශීතාගාර**<br>කර්මාන්ත හා වාණිජ අංශයන්හි භාවිතා වන පැරණි අකාර්යක්ෂම ශීතාගාර වෙනුවට කාර්යක්ෂම ශීතාගාර ප්‍රතිස්ථාපනය කිරීමෙන් බලශක්ති ඉතිරිය වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය මුදලක් අපේක්ෂිතය. | 41 |
| **5** | **කාර්යක්ෂම මෝටර**<br>කාර්මික අංශයේ භාවිතා වන පැරණි මෝටර වෙනුවට ආදේශ කිරීම සඳහා නව කාර්යක්ෂම මෝටර හා VSD සැපයීම. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ නිර්ණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරමින් පවතී. | 86 |
| **6** | **තාප දීප්ත ගෘහස්ත සූත්‍රිකා පහන් භාවිතයෙන් බැහැර කිරීම**<br>මාසික විදුලි පරිභෝජනය විදුලි ඒකක 90ට වඩා අඩු ගෘහ ඒකක සඳහා එල්ඊඩී පහන් (LED Lamp) ලබා දීමේ “ශක්ති” නමින් හඳුන්වන වැඩසටහන වර්ෂ 2019 මාර්තු මාසයේද ආරම්භ කිරීමට නියමිතව ඇත. මෙම ගෘහ ඒකක වෙත එල්ඊඩී පහන් මිලියන 10 ක් බෙදා හැරීමට නියමිතව ඇති අතර, වර්ෂය අවසන් වන විට රු. මිලියන 12,710 ක් ඉතිරි කර ගැනීමට බලාපොරොත්තු වේ. එල්ඊඩී පහන් භාවිතය මගින් මසකට කිලෝ වොට් පැය 6 ක් ඉතිරි වනු ඇත. මෙම ප්‍රමාණය, විදුලි ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සඳහා වන වියදම් සමඟ සැලකිල්ලට ගත් විට, රු. 120/- ක වටිනාකමකි. එක් ගෘහ ඒකකයකට එක් එල්ඊඩී පහනක් සැපයීම සඳහා වන වියදම රු. 169/- ක් වන අතර, සමස්ත වියදම මාසයක් හා දින 12 ක් තුළ ආවරණය කර ගනු ලැබේ. | 432 |
| **7** | **කාර්යක්ෂම විදුලි පංකා**<br>නිවාසවල භාවිතා වන පැරණි විදුලි පංකා වෙනුවට නව කාර්යක්ෂම විදුලි පංකා ප්‍රතිස්ථාපනය කරනු ඇත. | 298 |
| **8** | **හරිත ගොඩනැගිලි**<br>කාර්යක්ෂම ගොඩනැගිලි නිර්මාණ තාක්ෂණයන් කර්මාන්ත හා වාණිජ අංශයන්හි ප්‍රචලිත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. | 43 |
| **9** | **සුහුරු නිවාස**<br>නව නිවාස සැලසුම් කිරීමේදී බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි තාක්ෂණයන් භාවිතය ප්‍රචලිත කිරීම මෙම ව්‍යාපෘතියේ පරමාර්ථයයි. නව නිවාස ඉදි කිරීමේදී සම්බන්ධ කර ගත යුතු බලශක්තිය හා සබැඳි මාර්ගෝපදේශයන් සකස් කර ඇත. | 139 |
| **10** | **ප්‍රතික්‍රියක බලය කළමනාකරණය**<br>ප්‍රතික්‍රියක බලය කළමනාකරණය කිරීම තුළින් විදුලි සම්ප්‍රේෂණ කාර්යක්ෂමතාව ඉහල නැංවීම මගින් බලශක්තිය ඉතිරි කිරීම අපේක්ෂිතය. මෙයින් එක් ක්‍රමෝපායයක් නම්, කාර්මික හා වාණිජ ක්ෂේත්‍රයන්හි ජනනය වන ප්‍රතික්‍රියක බලය සඳහා වාණිජමය වටිනාකමක් ලබා දීමයි. මේ සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | 150 |
| | 2022 වර්ෂයේ අවසානය වන විට වාර්ෂික විදුලි ඉතිරිය<br>(වසර 2035 වන විට විදුලි ඉතිරියේ සමස්ත ශුද්ධ අගය ගිගා වොට් පැය 7523ක් වනු ඇත.) | **1,684** |

*වගු අංක 4.4*

**5. ව්‍යාපෘති මූල්‍යනය සහ මූල්‍යාධාර ලබා දෙන ආයතන අතර දායකත්ව සම්බන්ධීකරණය**

නව ව්‍යාපෘති ආරම්භ කිරීම හා විදුලිබල ක්ෂේත්‍රයේ නව ආයෝජන අවස්ථාවන් සඳහා උනන්දුවක් දක්වන විදේශීය නියෝජිත කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

**6. සංවර්ධන අංශය මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ**

1. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති සංශෝධනය කිරීම සහ එතෙක් සුළං සහ සූර්ය බලයට අමතරව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා යාන්ත්‍රනයක් ඇති කිරීම
2. සුළං බල උද්‍යාන ක්‍රියාත්මක කිරීම - මන්නාරම සුළං බලාගාරය
3. ගිවිසුම් කාලය අවසන් වූ කුඩා පරිමාණ ජල විදුලි බලාගාරවල ගිවිසුම් කාලය දීර්ඝ කිරීම හා ඒ සඳහා ගාස්තු නිර්ණය කිරීම
4. සූර්යබල සංග්‍රාමය වැඩසටහන ක්‍රියාත්මක කිරීම
5. ජෛව ස්කන්ධ බලාගාර සඳහා පිරිවැය පාදක ගාස්තු ගෙවීමේදී අවශ්‍ය කරන ජෛව ස්කන්ධ ලබා ගැනීම සඳහා වන මිල නියම කිරීම
6. වහල මත සවි කරන සූර්ය ජනන ව්‍යාපෘතිය "සූර්ය බල සංග්‍රාමය" ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යමය ආධාර
7. වෙනස් වන ඉන්ධන මිලට සාපේක්ෂව විදුලි ඒකකයක නිෂ්පාදන පිරිවැය මත ඇති වන බලපෑම සමනය කිරීම සඳහා වන විසඳුම් සොයා බැලීමට කමිටුවක් පත් කිරීම - ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය
8. "ජෛව බලශක්ති 2022" ආර්ථික සංවර්ධනය උදෙසා ජෛව බලශක්ති ව්‍යාපෘතිය
9. විදුලිබල පද්ධතියේ තාක්ෂණික තත්ත්වයන්ට ගැලපෙන ලෙසින් හඳුනාගත් සුළං සහ සූර්ය බල ධාරිතාවයන් වර්ෂ 2020 වන විට සංවර්ධනය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම

**7. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පනත යටතේ වන කාර්යයන්**

තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මෙම අමාත්‍යාංශයට අයත් සියලු අදාළ කාර්යයන් මෙම අංශය මඟින් සිදු කෙරේ. 2018 වර්ෂය තුළ දී තොරතුරු ඉල්ලීම් 38 ක් ලැබී ඇත. ඉන් ඉල්ලීම් 11 ක් සඳහා සම්පූර්ණයෙන් තොරතුරු සපයා ඇති අතර, ඉල්ලීම් 02 ක් සඳහා තොරතුරු කොටසක් පමණක් (පනතේ විධිවිධාන අනුව) සපයා ඇත. පනතේ 5 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව ඉල්ලීම් 08 ක් ප්‍රතික්ෂේප කර ඇත. පනතේ 5 වන වගන්තියේ ප්‍රතිපාදන යටතේ නොගැනෙන වෙනත් හේතූන් මත ඉල්ලීම් 13 ක් ප්‍රතික්ෂේප කර ඇත. 2018 වර්ෂය තුළ දී අභියාචනා 05 ක් නම් කළ නිලධාරියා වෙත ඉදිරිපත් වූ අතර, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

**8. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගැනීම හා තොරතුරු තාක්ෂණ කාර්යයන්.**

- වර්ෂය පුරා නවතම තොරතුරු යාවත්කාලීන කරමින් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පවත්වා ගෙන ගොස් ඇත.
- 2018 තොරතුරු තාක්ෂණ සැලැස්ම සකස් කරන ලදී. අමාත්‍යාංශයේ සියලු තොරතුරු තාක්ෂණ කාර්යයන් මෙම ඒකකය මගින් සිදු කරන ලදී.

# 05. තාක්ෂණ අංශය

## ප්‍රධාන කාර්යයන්

විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රධාන කාර්යයන් ලෙස අනාගතයේ බලාපොරොත්තු වන ආර්ථික හා කාර්මික සංවර්ධනය හේතුවෙන් වැඩිවෙමින් පවතින විදුලිබල ඉල්ලුම සැපයීම සහ තත්වයෙන් ඉහළ විශ්වසනීය විදුලි සැපයුමක් මහජනතාවට දරාගත හැකි මිලකට ඔවුනට ලබා දීම, පාරම්පරික බලශක්ති ප්‍රභවයන් ප්‍රයෝජනයට ගැනීම, ඉල්ලුම් කළමනාකරණ මැදිහත්වීම් වැනි කාර්යයන් දැක්විය හැකිය. තාක්ෂණ අංශයේ කාර්යභාරය වන්නේ අමාත්‍යාංශයට අදාළ වැඩසටහන් වල ප්‍රතිපත්ති සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය වන තාක්ෂණික අවශ්‍යතා සහ තාක්ෂණ සහයෝගය ලබා දීමයි.

1. ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ විධිවිධාන සංශෝධනය කිරීම හා නීති රෙගුලාසි බලාත්මක කිරීම, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම, විදුලි අයක්‍රම සකස් කිරීම, විදුලි බලපත්‍ර නිකුත් කිරීම ආදි කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.

2. ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධ නීති සම්පාදන කටයුතු සිදු කිරීම

3. පරමාණුක බලශක්ති මණ්ඩලය, පරමාණුක බලශක්ති නියාමන කොමිෂන් සභාව සම්බන්ධ නීති සම්පාදන කටයුතු සිදු කිරීම

4. ඉඩම් අත්පත් කර ගැනීම හා ව්‍යාපෘති අනුමැතිය හැර සියලු විදුලි උත්පාදන ව්‍යාපෘති වලට (ජල විදුලිය, න්‍යෂ්ටික බලය, ගල් අඟුරු සහ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති) අදාළ තාක්ෂණික කරුණු සම්බන්ධ කටයුතු

5. සියලු විදුලිබල හා බලශක්ති සැලසුම්කරණ කටයුතු අධීක්ෂණය හා පාලනය කිරීම

6. බලශක්ති සංරක්ෂණය හා අදාළ තාක්ෂණික කටයුතු

7. විදුලි උත්පාදන බලාගාරවල ක්‍රියාකාරිත්වයේ අධීක්ෂණය, පාලනය හා සම්බන්ධ තාක්ෂණික කරුණු, බිඳවැටීම් වළක්වා ගැනීම, අවම කිරීම, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

8. විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අංශයට අදාළ SAARC, BIMSTEC,USAID,ESCAP,IEF වැනි අන්තර්ජාතක සංවිධාන සමඟ ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

9. අංශය වෙත අනුයුක්ත නිලධාරින්ගේ සහ සේවකයන්ගේ පරිපාලනය ඇතුළුව අංශයේ අභ්‍යන්තර පරිපාලනය සිදු කිරීම

10. ගරු විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන ඇමතිතුමා, ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය ඇමතිතුමා සහ ලේකම් විසින් වරින් වර විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික කරුණු සම්බන්ධව නියම කරනු ලබන වෙනත් රාජකාරි

## කාර්ය සාධනය

1. ශ්‍රී ලංකාවේ ජල විදුලිබල නිෂ්පාදනය සඳහා කෘත්‍රිම වර්ෂා ඇති කිරීමට තායිලන්ත රජයේ තාක්ෂණික ආධාර යටතේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම
2. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ අධ්‍යක්ෂ ජනරාල් ගරු යුකියා අමානෝ මැතිතුමාගේ රාජ්‍යතාන්ත්‍රික සංචාරය සැලසුම් කිරීම
3. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය සමඟ එළඹි ශ්‍රී ලංකාවේ ආරක්ෂණ විධිවිධාන අතිරේක ප්‍රොටෝකෝලය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම

4. 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතට ගෙන එනු ලැබූ සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම

5. ශ්‍රී ලංකා රජය සහ රුසියානු රජය අතර සාමකාමී කටයුතු සඳහා පරමාණුක බලශක්තිය උපයෝගී කර ගැනීම සඳහා වන සහයෝගිතා ගිවිසුම

6. රජයකින් රජයකට ලබා දීමේ පදනම මත මෙගාවොට් (MW) 500 ක ද්‍රවීකෘත ස්වාභාවික වායු බලාගාරයක් ඉන්දියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර සහ ඒකාබද්ධ ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දියානු රජයට අයත් සමාගමක් වන NTPC සමාගම සහ ශ්‍රී ලංකාවේ, ලංකා විදුලිබල මණ්ඩලය සමඟ අත්සන් කිරීමට නියමිත ඒකාබද්ධ ව්‍යාපෘති සහ කොටස්කරුවන්ගේ ගිවිසුම සඳහා දැනට දෙරට අතර සාකච්ඡා වාර කිහිපයක් පවත්වා ඇත

7. ශ්‍රී ලංකාවට න්‍යෂ්ටික විදුලිබලය යොදා ගැනීමට සුදුසුද යන්න අධ්‍යයනය කිරීම සඳහා අන්තර්ජාතික පරමාණු බලශක්ති ඒජන්සියේ ජාතික තාක්ෂණික සහයෝගිතාවයෙන් වැඩමුළු කිහිපයක් පැවැත්වීම

# 06.ටෙන්ඩර් අංශය

## ප්‍රධාන කාර්යයන්

විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ ටෙන්ඩර් අංශයට සියලු ප්‍රසම්පාදන ආශ්‍රිත කාර්යයන් හා එයට අදාළ සියලු කටයුතු කර ගෙන යන ලෙස පවරා ඇත. පහත සඳහන් වනුයේ අංශය මගින් සිදු කරනු ලබන ප්‍රධාන කටයුතුය.

1. අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටු වලට අදාළ කටයුතු.
2. අමාත්‍ය මණ්ඩලය පත් කළ සාකච්ඡා කමිටු වලට අදාළ කටයුතු.
3. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු වලට අදාළ කටයුතු.
4. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු සඳහා MPC හා SCAPC රැස්වීම් සංවිධානය කිරීම.
5. අදාළ ප්‍රසම්පාදන සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
6. ප්‍රසම්පාදන කටයුතු හා අදාළ ප්‍රගති වාර්තා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
7. ප්‍රසම්පාදනයන්ට අදාළ අනෙකුත් කටයුතු

## කාර්ය සාධනය

| | |
|---|---|
| 2016 ආරම්භ කොට කරගෙන යනු ලබන MPC ප්‍රසම්පාදන සංඛ්‍යාව | 10 |
| 2017 ආරම්භ කොට කරගෙන යනු ලබන MPC ප්‍රසම්පාදන සංඛ්‍යාව | 08 |
| 2018 වසරේ ආරම්භ කළ MPC ප්‍රසම්පාදන සංඛ්‍යාව | 46 |
| 2018 ප්‍රධානය කළ මුළු MPC ප්‍රසම්පාදන සංඛ්‍යාව | 09 |
| අවලංගු කළ ප්‍රසම්පාදනයන් සංඛ්‍යාව | 01 |

| | |
|---|---|
| 2016 සිට ආරම්භ කොට කරගෙන යනු ලබන CANC/CAPC/SCAPC/SSCAPC සංඛ්‍යා | 11 |
| 2017 සිට ආරම්භ කොට කරගෙන යනු ලබන CANC/CAPC/SCAPC/ SSCAPC සංඛ්‍යා | 15 |
| 2018 වසරේ ආරම්භ කළ CANC/CAPC/SCAPC/ SSCAPC සංඛ්‍යාව | 34 |
| 2018 වසරේ පිරිනමන ලද CANC/CAPC/SCAPC/ SSCAPC සංඛ්‍යාව | 27 |
| අවලංගු කළ ප්‍රසම්පාදනයන් සංඛ්‍යාව | 01 |

| | |
|---|---|
| 2018 වර්ෂයේ දී ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 28 |

*වගු අංක -6.1*

| අ.අ | ගොනු අංකය | කැබිනට් පත්‍රිකා අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | PE/TEN/SCAPC/ SL/2017/20 | 50/2018/PE | 23.08.2018 | නැවත ඇණවුම් කිරීම - ඒරියල් බණ්ඩල් සන්නායක (ABC) 3× 70 + 54.6 + 16 sqmm – 1500km සැපයීම හා බෙදාහැරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| 2 | PE/TEN/SCAPC /SG/2014/32 | 14/2018/PE | 09.02.2018 | හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන - ට්‍රාන්ච් 1 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම පැකේජ 1 - ලොට් A1 මූලික වැඩ |
| 3 | PE/TEN/SSCAPC /SP/2017/52 | 03/2018/PE | 01.02.2018 | පුත්තලම ගල් අඟුරු බලාගාරය සඳහා හදිසි අවස්ථා මිලදීගැනීම් (Spot Tender) යටතේ අවශ්‍ය ගල් අඟුරු මිලදීගැනීම ක්ෂණික මිලදීගැනීම - 11 |
| 4 | PE/TEN/SCAPC /SM/2015/07 | 06/2018/PE | 09.02.2018 | පහත ව්‍යාපෘති සඳහා ජාතික ගොඩනැගීමේ බදු ගෙවීම (NBT) පොල්පිටිය (සමණල) විදුලි බලාගාර පුනරුත්ථාපන ව්‍යාපෘතිය කොන්ත්‍රාත්තුව No: GP/DGM/Rehab/Polpitiya 2 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වික්ටෝරියා විදුලි බලාගාරය ස්ථායුකය ප්‍රතිස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| 5 | PE/TEN/SCAPC/ SS/2015/50 | 08/2018/PE | 26.12.2017 | හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන - ට්‍රාන්ච් 2 (GPG & EEIIP TR -II<br>පැකේජ 1 - ලොට් B<br>පොල්පිටිය, හම්බන්තොට 220kV, කි.මි. 150 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම<br>(CEB/AGM/TR/2016/ICB/GPDEE IIP-2-1B)<br>කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| 6 | PE/TEN/SCAPC /SL/2017/20 | 07/2018/PE | 15.02.2018 | ඒරියල් බණ්ඩල් සන්නායක (ABC) 3× 70 + 54.6 – 700km Ref.No.DD2/P & D/ICB/2017/026/C සැපයීම හා බෙදාහැරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| 7 | PE/TEN/SCAPC /SP/2017/42 | 10/2018/PE | 21.02.2018 | රට තුළ අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා මෙගාවොට් 100ක අතිරේක විදුලි ධාරිතාවයක් ප්‍රසම්පාදනය කිරීම DGM (EPT/EMPWR/2017/01 |
| 8 | PE/TEN/SCAPC /SG/2016/59 | 11/2018/PE | 21.02.2018 | මෙගාවොට් 10 වවුනතිව් සූර්ය බලාගාරය ඉදිකිරීම, අයිතිය සහ පවත්වා ගෙනයාම සඳහා ව්‍යාපෘතිය පිරිනැමීම |
| 9 | PE/TEN/SCAPC/ SG/2014/34-1 | 02/2018/PE | 15.01.2018 | 132/33kV පන්නල වායු නඩත්තු කිරිම, 132/33 kV අමතර කොටස් දෙකක් සැපයීම හා බෙදාහැරිම, 31.5 MVA ප්‍රමාණයේ බලශක්ති පරිවර්තකය සහ 36 GIS අනුසාරිත පුවරු 5ක් භාවිතය සඳහා සැපයීම හා ස්ථාපනය |
| 10 | PE/TEN/SCAPC /SC/2017/50 | 13/2018/PE | 07.03.2018 | කැළණිතිස්ස ද්විත්ව චක්‍ර විදුලි බලාගාරයේ GE frame 96 ගෑස් ටර්බයිනය සඳහා නව උපාංග මිලදී ගැනීම (KCCPS) (KCCPS/MEkar)/IND/2012/24) |
| 11 | PE/TEN/CANC/ SS/2016/22 | 15/2018/PE | 15.03.2018 | ලංකා විදුලිබල මණ්ඩලය පුද්ගලික බලාගාර වලින් දැනට විදුලිය මිලදී ගන්නා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් වල ගිවිසුම් කාලය දීර්ඝ කිරීම. |
| 12 | PE/TEN/SCAPC /SS/2015/48-1 | 16/2018/PE | 21.03.2018 | හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන - ට්‍රාන්ච් 2 GPD & EEIIP<br>පැකේජ 3 - ලොට් A2<br>උපලොට් 2 - කොටුගොඩ, කොළොන්නාව, පාදුක්ක, හොරණ ග්‍රිඩ් උපපොළවල් වැඩිදියුණු කිරීම<br>උපලොට් 1 - දෙහිවල සහ මාදම්පෙ ග්‍රිඩ් උපපොළවල් වැඩිදියුණු කිරීම<br>No. CEB/AGM/TR/2016/IFB/GPDEEIIP2-3A2)<br>කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම |
| 13 | PE/TEN/SCAPC /SP/2017/42 | 17/2018/PE | 02.04.2018 | රට තුළ අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා මෙගාවොට් 100ක අතිරේක විදුලි ධාරිතාවයක් ප්‍රසම්පාදනය කිරීම |
| 14 | PE/TEN/SCAPC /SS/2015/48-II | 18/2018/PE | 07.04.2018 | හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන - අදියර 2<br>පැකේජ 3 - ලොට් B - බියගම 220/33 kV ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම -(CEB/AGM/TR/2016/ICB/GPDEEIIP2 – 3B) |
| 15 | PE/TEN/SCAPC /SS/2015/50 | 25/2018/PE | 25.04.2018 | හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන - ට්‍රාන්ච් II |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පැකේජ 1 - ලොට් A - හම්බන්තොට 220/132 kV ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සහ පවතින 132/33 kV හම්බන්තොට ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම |
| 16 | PE/TEN/SCAPC /SC/2017/11 | 27/2018/PE | 04.05.2018 | ලංකා විදුලිබල මණ්ඩලයේ ලක්විජය විදුලි බලාගාරයේ ඉංජිනේරුවන් සඳහා නිවාස සංකීර්ණ 08ක් සහ නේවාසිකාගාරයක් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම CEB(DGM CDS, E &CSM) 12017101 |
| 17 | PE/TEN/SCAPC /SK/2016/31 | 29/2018/PE | 11.06.2018 | කෙරවලපිටිය ද්‍රව ස්වභාවික වායු බලාගාරය (LNG) ප්‍රසම්පාදනය |
| 18 | PE/TEN/SCAPC /SK/2016/71 | 34/2018/PE | 02.05.2018 | ඒරියල් බණ්ඩල් සන්නායක ALU (ABC) 3× 70 + 54.6+16 sqmm – 2500km සැපයීම හා බෙදාහැරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| 19 | PE/TEN/SCAPC /SG/2016/59 | 35/2018/PE | 22.06.2018 | මෙගාවොට් 10 පොළොන්නරුව සූර්ය බලාගාරය ඉදිකිරීම, අයිතිය සහ පවත්වා ගෙනයාම සඳහා ව්‍යාපෘතිය පිරිනැමීම |
| 20 | PE/TEN/SCAPC /SS/2015/48 | 37/2018/PE | 02.07.2018 | හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන - අදියර 2<br>ට්‍රාන්ච් 2 - පැකේජ 3 - ලොට් A1<br>කොළඹ B ග්‍රිඩ් උප පොල ඉදි කිරීම, කොලොන්නාව සහ කොළඹ සී උපපොළවල් අතර ඇති කි.වො. 132, වර්ග මි.මී. 800 කේබලයෙන් විදුලිය ලබා ගැනීමේ සහ පිට කිරීමේ සම්බන්ධතාවය පිහිටුවීම සහ කොලොන්නාව සහ කොළඹ සී උපපොළවල් වැඩිදියුණු කිරීම |
| 21 | PE/TEN/SCAPC /SC/2017/16 | 36/2018/PE | 25.06.2018 | ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමණාකරණ ජාතික වැඩසටහන යටතේ අඩු විදුලි පරිභෝජනයක් සහිත නිවාස ඒකක වෙත ලබා දීම සඳහා ආලෝක විමෝචන ඩයෝඩ විදුලි පහන් මිලියන 10ක් මිලදී ගැනීමේ ටෙන්ඩරය ප්‍රදානය කිරීම DD1/P&D/ICB/2017/028/C |
| 22 | PE/TEN/SCAPC /SG/2015/38 | 44/2018/PE | 13.07.2018 | ජාතික සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් ජාල සංවර්ධනය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය. (NTDND & EIP) - පැකේජ 2 - ග්‍රිඩ් උප පොල ඉදි කිරීම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම<br>CEB/PD/NTDND&EIP/P2 |
| 23 | PE/TEN/SCAPC /SC/2017/38 | 47/2018/PE | 21.08.2018 | සූර්ය බල සංග්‍රාමය අදියර 02 වැඩසටහන යටතේ තරඟකාරී ලංසු කැඳවා විවෘලා මිල ගණන් යටතේ කුඩා පරිමාණ සූර්ය බල විදුලි බලාගාර 1MW X 90Nos. පිහිටුවීම සඳහා කොන්ත්‍රාත්තු පිරිනැමීම. මතුගම, ගාල්ල, බෙලිඅත්ත, මාතර සහ පල්ලේකැලේ ග්‍රිඩ් උපපොළ 5 සඳහා<br>කොන්ත්‍රාත් අංක : CEB/REDPM/SP/SBS-P II (90) |
| 24 | PE/TEN/SCAPC /SS/2016/20 | 51/2018/PE | 03.09.2018 | මන්නාරම දූපතේ 100MW වූ අර්ධව යැවිය හැකි සුළං මෝල සඳහා EPC කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
